කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2024

2026 - අප්‍රේල්

**BCOME 1055 – ව්‍යාපාර හා කාර්මික නීතිය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්ණ අංක 01**

අ) නීතියේ ආධිපත්‍යය පිළිබඳ සංකල්පය සාකච්ඡා කරන්න. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක එහි වැදගත්කම සහ ප්‍රධාන මූලධර්ම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) ශ්‍රී ලංකාවේ නීතියේ ප්‍රධාන මූලාශ්‍ර පහත සඳහන් දෑ ඇතුළුව හඳුනාගෙන පැහැදිලි කරන්න.

i. නීති සම්පාදනය
ii. අධිකරණ පූර්වාදර්ශය
iii. සිරිත්

(ලකුණු 10)
**(මුළු ලකුණු20)**

**ප්‍රශ්ණ අංක 02**

අ) වලංගු ගිවිසුමකට අවශ්‍ය අංග පහක් කෙටියෙන් පැහැදිලි කරන්න

(ලකුණු 10)

ආ) නිමල් තම යතුරුපැදිය පෙරේරාට රුපියල් 500,000 කට විකිණීමට අර්පනයක් ඉදිරිපත් කරයි. පෙරේරා ප්‍රතිචාර දක්වමින් කියා සිටියේ එය රුපියල් 450,000 කට මිලදී ගන්නා බවයි. නිමල් මෙම පණිවිඩයට පිළිතුරු දුන්නේ නැත. දින තුනකට පසු පෙරේරා නිමල්ට දැනුම් දුන්නේ රුපියල් 500,000 කට යතුරුපැදිය මිලදී ගැනීමට තමා කැමැත්තෙන් සිටින බවයි. කෙසේ වෙතත්, නිමල් තවදුරටත් උනන්දුවක් නොදක්වන බව පවසමින් යතුරුපැදිය විකිණීම ප්‍රතික්ෂේප කළේය. ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් නිමල්ට එරෙහිව නඩු පැවරීමට පෙරේරා දැන් අදහස් කරයි. ඔහු සහ නිමල් අතර වලංගු ගිවිසුමක් තිබේද යන්න දක්වමින් පෙරේරාට උපදෙස් දෙන්න.

අදාළ නීතිමය මූලධර්ම සහ තීරණය කරන ලද නඩු යොදා ගනිමින් පිළිතුරු තීන්දු දක්වන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 03

අ) නදීෂා කොළඹ පිහිටි ගෙස්ට් හවුස් එකක රාත්‍රී දෙකක් ගත කිරීම සඳහා කාමරයක් වෙන්කරවා ගත්තාය. පිළිගැනීම් කවුන්ටරයෙන් ඇයට සම්පූර්ණ මුදල ගෙවූ විට කාමර යතුර ලබා දුන්නාය. කාමරය වෙන්කරවා ගැනීමේදී හෝ ගෙවීමේදී කිසිදු නියමයක් හෝ කොන්දේසියක් සඳහන් කර නොතිබුණි. කාමරයට ඇතුළු වූ පසු, දොර පිටුපස බිත්තියේ එල්ලා තිබූ දැන්වීමක් ඇය දුටුවාය: "අමුත්තන්ගේ පෞද්ගලික බඩු බාහිරාදිය නැතිවීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකිව යුතු නොවේ. "එදින සවස ඇය කාමරයෙන් පිටතට ගොස් සිටියදී, ඇගේ ලැප්ටොප් පරිගණකය සහ වටිනා භාණ්ඩ කාමරයෙන් සොරකම් කරන ලදී. කාමරයේ පළ කර ඇති දැන්වීම උපුටා දක්වමින් ගෙස්ට් හවුස් කළමනාකාරිත්වය ඇයට වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කළේය. නදීෂා ගෙස්ට් හවුස් එකට එරෙහිව නීතිමය පියවර ගැනීමට අදහස් කරයි. ගෙස්ට් හවුස් කළමනාකාරිත්වයට බැහැර කිරීමේ වගන්තිය මත විශ්වාසය තැබිය හැකිද යන්න නදීෂාට උපදෙස් දෙන්න

(ලකුණු 10)

ආ) ගිවිසුම නීතියේ සඳහන් (පොදු, අන්‍යෝන්‍ය සහ ඒකපාර්ශ්වික) විවිධ ආකාරයේ වැරදි පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 04

අ) "භාවිතයට නොගත් සහ විශිෂ්ට තත්ත්වයේ ඇති, අලුත්ම 2023 මාදිලියේ විදුලි ස්කූටරයක්" විකිණීම සඳහා විකුණුම්කරුවෙකු විසින් පළ කරන ලද මාර්ගගත දැන්වීමක් නිරෝෂන් දුටුවේය. දැන්වීමේ පින්තූර සහ විස්තරයක් පමණක් ඇතුළත් විය. මෙම විස්තරය මත පදනම්ව ස්කූටරය භෞතිකව පරීක්ෂා නොකර මිලදී ගැනීමට නිරෝෂන් එකඟ විය.

මිලදී ගැනීමෙන් පසු, නිරෝෂන් සොයා ගත්තේ:

- ස්කූටරය ඇත්ත වශයෙන්ම නැවත සකස් කරන ලද 2021 මාදිලියකි
- එය මීට පෙර වසරකට වැඩි කාලයක් භාවිතා කර ඇත
- කොටස් කිහිපයක් ප්‍රතිස්ථාපනය කර ඇත

මිලදී ගැනීමට පෙර නිරෝෂන්ට එය පරීක්ෂා කිරීමට අවස්ථාව ඇති බවත් එබැවින් පැමිණිලි කළ නොහැකි බවත් තර්ක කරමින් විකුණුම්කරු ස්කූටරය ආපසු ගැනීම ප්‍රතික්ෂේප කළේය. ස්කූටරය ප්‍රතික්ෂේප කර මුදල් ආපසු ලබා ගත හැකිද යන්න නිරෝෂන්ට උපදෙස් දෙන්න. අදාළ නීතිමය මූලධර්ම සහ තීරණය කරන ලද නඩු සමඟ ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 10)

ආ) භාණ්ඩ විකිණීමේ ගිවිසුමක භාණ්ඩ වල අයිතිය විකුණුම්කරුගෙන් ගැනුම්කරුට මාරුවීමට අදාල රීති අදාළ නඩු නීතිය සමඟ ඔබේ පිළිතුරට සහාය වන්න

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 05

අ) නියෝජ්‍යත්ව සම්බන්ධතාවයක් ඇති කර ගත හැකි විවිධ ක්‍රම පැහැදිලි කරන්න.

ඔබේ පිළිතුර උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) රමේෂ් සමාගමක කළමනාකාර අධ්‍යක්ෂවරයා වන නමුත් අභ්‍යන්තර එකඟ නොවීම් හේතුවෙන්, මණ්ඩලය විසින් රුපියල් මිලියන 1 ට වැඩි ගිවිසුම් වලට එළඹීමට ඔහුගේ බලය සීමා කරන ලදී. එසේ තිබියදීත්, රමේෂ් රුපියල් මිලියන 2 කට සිල්වා ට්‍රේඩර්ස් සමඟ ගිවිසුමකට එළඹියේය. සිල්වා ට්‍රේඩර්ස් මීට පෙර රමේෂ් සමඟ ගනුදෙනු කර ඇති අතර ඔහුට සම්පූර්ණ අධිකාරියක් ඇති බව විශ්වාස කළේය. රමේෂ් තම අධිකාරිය ඉක්මවා ගිය බව පවසමින් සමාගම දැන් ගිවිසුමට ගරු කිරීම ප්‍රතික්ෂේප කරයි. සමාගම ගිවිසුමෙන් බැඳී ඇත්දැයි උපදෙස් දෙන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 06

අ) පහත සඳහන් විවිධ වර්ගයේ හවුල්කරුවන් කවරේක්දැයි පැහැදිලි කරන්න.
   i. ක්‍රියාකාරී හවුල්කරුවන්
   ii. නිහඬ හවුල්කරුවන්
   iii. නාමික හවුල්කරුවන්
   iv. ප්‍රතිබන්ධන හවුල්කරුවන්

(ලකුණු 10)

ආ) සුනිල් සහ කමල් කොළඹ ගෘහ භාණ්ඩ ව්‍යාපාරයක හවුල්කරුවන් වේ. කමල්ට දැනුම් නොදී, සුනිල් සැපයුම්කරුවෙකුගෙන් ණයට දැව විශාල ප්‍රමාණයක් මිලදී ගත් අතර එය සාමාන්‍ය ව්‍යාපාරික පිළිවෙතකි. කෙසේ වෙතත්, ඔවුන්ගේ හවුල්කාරිත්ව ගිවිසුම අභ්‍යන්තරව මිලදී ගැනීම් රු. 500,000 හෝ ඊට අඩු ප්‍රමාණයකට සීමා කළේය. සැපයුම්කරු මෙම සීමාව ගැන නොදැන සිටියේය. පසුව, කමල් සැපයුම්කරුට ගෙවීම ප්‍රතික්ෂේප කළේ සුනිල්ට කිසිදු අධිකාරියක් නොමැති බව පවසමිනි. සමාගම සුනිල්ගේ ක්‍රියාවට බැඳී තිබේද? හේතු සමඟ සාකච්ඡා කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 07

අ) සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලෙන් මුදල් ලබා ගත හැකි අවස්ථා පහක් සඳහන් කරන්න

(ලකුණු 05)

ආ) රවිඳු කොට්ටාවේ කුඩා සුපිරි වෙළඳසැලක හිමිකරුවෙකි. කාර්යබහුල සති අන්ත සහ උත්සව කාලවලදී, භාණ්ඩ විකිණීම සඳහා සහාය වීම පිණිස ඔහු ඩිලානි පහත කොන්දේසි වලට යටත්ව සේවයේ යොදවයි.

- ඩිලානිව අවශ්‍ය විටෙක පමණක් වැඩට කැඳවනු ලැබේ, ප්‍රධාන වශයෙන් සති අන්තවල
- ඇයට සෑම දිනකම අවසානයේ දෛනික වැටුපක් ගෙවනු ලැබේ
- ඔවුන් අතර ලිඛිත ගිවිසුමක් නොමැත
- ඇයට නිවාඩු, EPF හෝ ETF ප්‍රතිලාභ සඳහා හිමිකම් නැත
- සමහර විට ඇය ව්‍යාපාර ගණුදෙනු වැඩි වශයෙන් සිදුවන කාලවලදී සති කිහිපයක් අඛණ්ඩව වැඩ කරයි
- රවිඳු රාජකාරියේ යෙදී සිටියදී ඇගේ වැඩ සෘජුවම අධීක්ෂණය කරයි

වසරකට ආසන්න කාලයක් වරින් වර වැඩ කිරීමෙන් පසු, ඩිලානිට හදිසියේම ඇගේ සේවය තවදුරටත් අවශ්‍ය නොවන බව කියනු ලැබේ. ඇය ස්ථිර සේවිකාවක් ලෙස සැලකිය යුතු බවත් රැකියා සුරක්ෂිතභාවය සහ ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇති බවත් ඇය කියා සිටී. ඩිලානි අනියම් සේවිකාවක් ද නැතහොත් නිත්‍ය සේවිකාවක් ද යන්න උපදෙස් දෙන්න. ඇයට කිසියම් නීතිමය ආරක්ෂාවක් හිමිවේද යන්න සාකච්ඡා කරන්න

(ලකුණු 15)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්ණ අංක 08**

අ) සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ සේවකයින්ට ලබා දී ඇති පහත සඳහන් විවිධ නිවාඩු වර්ග පැහැදිලි කරන්න.

i. වාර්ෂික නිවාඩු
ii. අනියම් නිවාඩු
iii. මාතෘ නිවාඩු

(ලකුණු 10)

ආ) i. වෘත්තීය සමිතියක් නිර්වචනය කරන්න.

ii. සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේදී එහි ප්‍රධාන කාර්යයන් සහ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**